


# ඇක්ටිව් රීඩිං



"කරන්න ආව වැඩේ අමතක වුණා නේ..."

කොම්පියුටරේ ළඟ මොකක්දෝ වැඩක් කර කර හිටපු පින්සල කුස්සිය දිහාවට යන්න ගිහින් එක පාරටම නතර වුණා.

'' ආපහු උන්නු තැනට යන්න, එතකොට ආයෙමත් මතක් වෙයි, මොකක්ද? කරන්න හිතාගෙන ආවේ කියලා '' පැන්සල ඇදුම් නවන ගමන් කිව්වා.

පින් ආපහු කොම්පියුටරේ ළඟට ගියා .

'' හරියට හරි .. දැන් මතක් වූණා..''

වෙබ් අඩවියක කෑම හදන වැඩ සටහනක් දැක්කමයි පින්ට මතක් වුණේ මාළුවක් තවම ලිපේ කියලා.

පන්හිඳත් තමන් කියව කියවා හිටිය පොත පැත්තක තිව්වේ මේ කතාවට හවුල් වෙන්න හිතාගෙන.

'' පින්ට් විතරක් නෙවෙයි. ඔය වැඩේ මටත් වෙලා තියෙනවා. පැන්ගේ ප්‍රතිකර්මය හරි. තමන් හිටපු තැනට ගියාම ආයෙත් අතරමගදී අමතක වුණ දේ මතක් වෙනවා''.

'' අපි යමක් කරන්න ඕන කියලා හිතපු හිතුවිල්ලට වඩා ලොකු දෙයක් අතරමගදී හිතට ආවම අර මුල් සිතුවිල්ලට බාධාවක් වෙනවා. අර මුල් පරිසරයට ගියාම මුල් හිතුවිල්ලට හේතු වුණ කාරණාව හරි, පරිසරය හරි ආයෙත් ඇති වෙනවා. ඒ නිසා යහපත් වුණ මුල් සිතුවිල් ආයෙමත් මතුවෙනවා. ඕක තමයි වෙනවා ඇත්තේ'' පැන් පණ්ඩිතයෙක් වගේ කිව්වා.

'' ඕක ඉතින් කියන්නත් දෙයැක් යැ. ඒක නේන්නං මේ වුණේ.. පින් හිනා වුණා.

'' මට දවසක් කැල්කියුලේටරෙ තියපු තැන අමතක වුණා'' පන්හිඳ තමන්ට වෙච්ච දෙයක් මතක් කළා''. '' මං ඉතින් කල්පනා කළා මං මොකක්ද අන්තිමේට කැල්කියුලේටරෙන් කළේ කියලා.

'' ඉතින් ඒ වැඩේ මතක් වුණා. ඒ කඩෙන් බඩු ගෙනාව බිල්වල ගණන් එකතු කරපු එක තමයි අන්තිමට කළේ. කොහේ ඉඳන්ද ඒ වැඩේ කළේ කියලා මතක් කළා. කෑම මේසේ ඉඳන් මම කෑම මේසේ ගාවට ගිහින් ඒ වැඩේ කරපු පුටුවේ ම ඉඳගත්තා. දැන් මට පෙනෙනවා ෆ්‍රිජ් එකට උඩින් තියෙන රාක්කය. ගණන් ලියන පොත තියෙන්නේ ඒ රාක්කයේ. රාක්කය ළඟට ගිහින් ඒ පොත උස්සල බලපුවාම මේ තියෙන්නේ කැල්කියුලේටරෙ''

'' අමතක වෙන දේවල් වගේම තමයි අපි හිතට ඇතුළු කරගත්ත දේවල් තව වැඩ මොනතරම් තිබුණාත් අමතක නොවී තියෙන එකත් '' ඒ පැන්

' ඒ කිව්වේ ?'' පින් උනන්දුයි.

'' මට වෙච්ච දෙයක් කියන්නං. මං වැඩට යන්න කලින් හිතුවා අද නම් කන්තෝරුවේ දී තේ බොන කෝප්පෙ මාරු කරන්න ඕන කියලා. ගෙදර තිබුණ අළුත් කෝප්පයකුත් බෑග් එකට දාගත්තා. ඇත්තම කියනවානම් මඟ දී, කෝච්චියේ දී මුණ ගැහුණ යාළුවෙක් එක්ක කතා කර කර ගිය නිසා කන්තෝරුවට යන කොට අර කෝප්ප මාරු කෙරිල්ල අමතක වෙලයි තිබුණේ. පරණ කෝපපෙ තියලා තියෙන්නේ තේ හදන තැන රාක්කේ. පුදුමේ කියන්නේ ඒ පැත්තට ගියෙත් නැතිව, බෑග් එක ඇතුලේ තියෙන අළුත් කෝපපේ දකින්න කලින් කෝප්ප මාරු කෙරිල්ල මත්ක වුණා''.

'' යටි හිතේ යමක් තැන්පත් වුණාම ඒක ආයෙත් හරි වෙලාවට මතක් වෙනවා. ඒත් ඒක හරියට තැන්පත් වුණා ද කියන එකයි වැදගත් වෙන්නේ. කෝප්ප මාරුකෙරිල්ලේ තකාවේ දී ඒ වෙනුවෙන් යමක් ගෙදරදී කළානේ අළුත් කෝප්පයක් බෑග් එකට දාගන්න කොට ඒ හිතුවිල්ල ඒ ක්‍රියාකාරකමක් එක්ක හිතේ හොඳින් තැන්පත් වෙන්න ඇති. ඒකයි, ඒ වැඩේ කන්තෝරුවේ දී ඉබේම මතක් වෙන්න ඇත්තේ'' පැන් ඒ ගැන විශ්ලේෂණයක් කළා.

'' පොතක් කියවන කොට වුණත් යමක් කරමින් කියෙව්වොත් ඒ පොතේ තියෙන දේවල් ධාරණය වෙනවා කියලනේ කියන්නේ '' පින් තමන් අහලා තියෙන දෙයක් මතක් කළා''

'' වෙන දෙයක් කරන ගමන් කොහොමද' පොතක් කියවන්නේ ?'' පැන් හිනාවුණා''

'' මොකද බැරි ? '' ඇයි මේ රටේ සමහර අය ඇවිදින ගමන් පොත් කියවන්නේ ?'' වැසිකිළියට යනකොට පත්තරයක් අරගෙන යන අය ඉන්නේ '' පැන් පින්ට උත්තර බැන්දා.

'' නෑ මම කියන්නේ එහෙම දෙයක් ම නෙවෙයි. ඒ පොතේ තමන් කැමති කොටස් යටින් ඉරි අඳින එක, පොතේ ම පැත්තක හරි වෙනින් පොඩි සටහන් පොතක හරි කෙටි සටහන් ලියන එක, "හයිලයිට්" කරන එක වගේ දේවල්." '' පන් පොත ආයෙමත් අතට ගත්තේ නොදැනීම වාගේ''

'' ඔය කියන්නේ '' ක්‍රියාකාරී කියවීම'' ගැන, පින් කිව්වා.

'' ඇත්තටම ක්‍රියාකාරී කියවීම නිසා කාරණා දෙක තුනක් ම පිරිමැහෙනවා. එකක් කියවීමට හොඳින්ම අවධානය යොමු වෙන එක. ඒ නිසාම හොඳින් ධාරණය වෙන එක දෙවෙනි එක. තමන්ට අපැහැදිලි දෙයක් තියෙනවානම් කාගෙන් හරි අහගන්න පුළුවන් තමන් දාගන්න සටහන්වලින්. ඒ තුන් වෙනි කාරණය. පොත කියවලා ඉවරවෙන කොට තමන්ට වැදගත් දේ ඉබේට ම ලකුනු වෙන එක හතර වෙනි එක. ආයෙමත් දවසක පොත අතට ගත්තම ඒ කාරණා මතක් කර ගන්න එකට ඇය මහන්සි වෙන්න දෙයක් නෑ. තමන් ලියූ කෙටි සටහන්, යටින් ඉරි ඇඳපු තැන් තව කෙනෙකුටත් පොත කියවෙනකොට උදව්වක් වෙන්නත් පුළුවන්. ඒ පස් වෙනි කාරණය'' පන් පැහැදිලි කළා.

'' ඒ වගේම තමයි ඒ සටහන් තව කෙනෙකු ඒ පොත කියවනකොට කරදයක් වෙන්නත් පුළුවන් ?'' පින් හිනාවුණා.

''පොතක් ගැන විචාරයක් එහෙම ලියනවානම් මේ ක්‍රියාකාරී කියවීම හරිම වැදගත් වෙනවා. පොතේ සමහර කොටස් උද්ධෘත හැටියට අරගෙන දක්වන කොට පිටු අංක පවා සටහන් කරන්න වෙනවා. ඒ වැඩේට ඉතින් '' පොත් ලකුණු'' තියාගන්නත් පුළුවන්. ඒවට අපි කියන්නේ '' බුක් මාර්ක්-ස්'' (ඊදදක ඒරනි) කියලනේ. ඒ වාගේම පිටු ලකුණු කරන '' ෆ්ලෑග්ස්'' (තක්ට්) වුණාත් යොදා ගන්නවා'' පන්හිඳ තමන් දන්න දේ කියාගෙන කියාගෙන ගියා''

''පොත් පත් කියවන අයට මේ දේවල් අමුතු කාරණා නෙවි. ඒත් ඉතින් මේ සුළු දේවල් කොහේවත් පිළිවෙළකට ලියවියලා තියෙනවාද කියලා නම් මට සැකයි. එහෙම තියෙනවා නම් කැමතියි දැනගන්න ඒ ගැන'' පින් කිව්වේ අවංකව ම.''

කාලෙකට ඉස්සර ''බුක්මාර්ක්'' එකක් වෙනුවෙන් ලියපු කෙටි නිසඳැසක් පන්ට මතක් වූණා. දළගකාර පාසැල් දැරියන් කීප-දෙනෙක් කරපු ආරාධනයකටයි පන් මේ වචන ටික ලිව්වේ. නුගේගොඩ '' ලීඩ්ස්'' උසස් අධ්‍යාපන ආයතනයේ සිසු සිසුවියන් දියත් කරපු ''නිමිතෙර" වැඩසටහනේ ප්‍රචාරක කටයුත්තක් විදියටයි ඒ අය 2001 දී මේ '' පොත් ලකුණු'' මුද්‍රණය කරලා බෙදලා හැරියේ.

සුරත් පළයක<br>
මිහිරියාවකි<br>
සියොත් රැනක<br>
සිතැඟියාවකි<br>
එදත් රහසකි !<br>
අදත් රහසකි !!<br>
හෙටත් රහසකි !!!<br>
බාලයේ කෙළි ලොල් විසේ !

'' ආන්න හරි '' ඇක්ටිව් රීඩිං, ඇක්ටිව් රීඩිං, ඇක්ටිව් රීඩිං ...! '' (ජඑසඩැ සෑඅසබට) '' පැන්ට මතක් වුණා.

